(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(7).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2025 ජනවාරි 28 අඟහරුවාදා

## 2025 පෙබරවාරි 18 අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

98/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 ඔක්තෝබර් 22 සිට 2024 ඔක්තෝබර් 21 දක්වා ඛනිජ තෙල් අලෙවි කිරීමෙන් උපයන ලද බදු ආදායම කොපමණද;

(ii) එම කාල සීමාව තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයන ලද ලාභය/ ලැබූ අලාභය කොපමණද;

(iii) එම කාල සීමාව තුළ ඉන්ධන අළෙවි කිරීමේදී වංචා සිදු වී තිබේද;

(iv) එසේ නම්, ලීටරයකින් වංචා කරන ලද මුදල එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වංචා කරන ලද මුළු මුදල කොපමණද;

(vi) ඉන්ධන ලීටරයකින් වංචා කරන ලද මුදල අඩු කිරීමෙන් පසු ලැබිය යුතු සහනය මේ වනවිට ජනතාව වෙත ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

112/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) මේ වනවිට එම කලාපය සඳහා ලැබී ඇති ආයෝජන සංඛ්‍යාව හා ඒවායේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයෝජන තුළින් මේ වනවිට උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අපනයන කලාපය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

133/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ විභාග කරමින් පවතින අවුරුදු පහ ඉක්ම වූ සහ අවුරුදු දහය ඉක්මවූ සිවිල් නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නඩු විභාග කර අවසන් කිරීමේදී පවතින ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

247/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ‘COVID-19 වැළඳී ඇතැයි සැක කෙරෙන රෝගීන් සහ තහවුරු කරන ලද රෝගීන් පිළිබඳව වන සායනික පුහුණු මාර්ගෝපදේශකය’ නමැති ප්‍රකාශනය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රකාශනයට අන්තර්ගතය සහ නිර්දේශ මඟින් දායක වූ විශේෂඥයින්ගේ නම් කවරේද;

(iii) ඔවුන් විශේෂඥ සම්පත්දායකයින් ලෙස සේවය කරන අවස්ථාවේදී ඔවුන් අනුබද්ධිතව සිටි ආයතන සහ ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iv) ඔවුන් පත් කිරීම සඳහා වගකීම දැරූ බලධාරියා කවුරුන්ද;

(v) ඔවුන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක/පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රකාශනයේ 7 වන ඡේදය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සඳහා වගකිව යුතු නිශ්චිත විශේෂඥ සම්පත්දායකයින්ගේ නම් කවරේද;

(iii) 7 වන ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සකස් කිරීම සඳහා භාවිතා කරන ක්‍රියාවලිය, ලේඛන සහ ආශ්‍රේය ග්‍රන්ථ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 7 වන ඡේදයේ නිර්දේශ දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් වෛද්‍ය ආචාර ධර්ම සහ වෛද්‍ය මානව විද්‍යාව යන ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ වෘත්තීය මතයට භාජනය වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

296/2024

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා පාසල්වලින් ජාතික පාසල් සඳහා රජයේ ගුරුවරුන් අනුයුක්ත කර ඇති බව දන්නේද;

(ii) එම ගුරුවරුන් අනුයුක්ත කර ඇති කාල සීමාව නැවත දීර්ඝ නොකිරීමට තීරණය කර තිබේද;

(iii) එම කාල සීමාව දීර්ඝ නොකිරීම හේතුවෙන් ජාතික පාසල්වල ඇති වන ගුරු පුරප්පාඩු තුලනය කරනු ලබන ආකාරය කෙසේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2025 පෙබරවාරි 19 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

152/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා, — බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෙරවලපිටියේ පිහිටුවා ඇති කසළ මගින් විදුලිය උත්පාදනය කරන විදුලි බලාගාරයේ (Waste-to-Energy Power Plant) උත්පාදනය කරනු ලබන විදුලිය ඒකකයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවනු ලබන මිල කොපමණද;

(ii) එම බලාගාරය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා දිනකට අවශ්‍ය වන කසළ ප්‍රමාණය මෙට්‍රික්ටොන් කොපමණද;

(iii) 2024 වර්ෂය තුළ එම බලාගාරය වෙත දෛනිකව සපයනු ලැබූ කසළ ප්‍රමාණයේ සාමාන්‍ය අගය මෙට්‍රික්ටොන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත බලාගාරය සඳහා කසළ සැපයීම සිදු කරනු ලබන පළාත් පාලන ආයතන කවරේද;

(ii) කසළ දහනය කිරීමෙන් පසුව මේ වනවිට ඉහත බලාගාර පරිශ්‍රය තුළ එක්රැස් වී ඇති අළු ප්‍රමාණය කොපමණද;

(iii) බලාගාරයෙන් නිකුත් වන අළු පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ඉහත බලාගාරය සඳහා 2023 වර්ෂයට අදාළව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

179/2024

ගරු රවී කරුණානායක මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාගත කරන ලද දිනය කවදාද;

(ii) රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලය සඳහා ආයෝජනය කරන ලද මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙන ලද කෙටි-කාලීන හා දිගු-කාලීන ණය මුදල්වල එකතුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලිබල මණ්ඩලය තුළ සේවය කරන ස්ථිර හා අනියම් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වැටුප්, අතිකාල දීමනා, වෘත්තීයවේදී දීමනා, ප්‍රසාද දීමනා, ප්‍රවාහන වියදම් සහ වෙනත් කවර හෝ පාරිශ්‍රමික සඳහා දරන ලද මුළු මාසික පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය සිය කාර්ය මණ්ඩලය වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු ගෙවන්නේද;

(iv) නොඑසේ නම්, එම ආයතනය උපයන විට ගෙවීමේ බදු ගෙවීම නැවැත්වූ දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

245/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර පාලනය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘති අතරින් මේ දක්වා ක්‍රියාත්මක නොකර ඉතිරිව ඇති ව්‍යාපෘති කවරේද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානුව, අරමුදල් සපයා ගනු ලබන ආකාරය සහ ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

257/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ 'හෝලුවගොඩ' සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත කෘෂිකාර්මික භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණය කෘෂිකර්මාන්ත කටයුතු සඳහා යොදා ගැනීමට මේ වනවිට ඇති බාධා කවරේද;

(iv) එම ව්‍යාපෘතිය වෙනුවෙන් මේ දක්වා කරන ලද වියදම් හා සංසන්දනය කිරීමේදී, එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

440/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගනය (නගර සභා ක්‍රීඩාංගනය) ක්‍රීඩා තරග පැවැත්වීම සඳහා යෝග්‍ය තත්ත්වයක නොපවතින බවත්;

(ii) එම ක්‍රීඩාංගනයේ ජලය බැස යාම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්;

(iii) එහි ඉදිකර ඇති කානු පද්ධතිය හේතුවෙන් ක්‍රිකට් තරග පැවැත්වීමට නොහැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2024 දක්වා එම ක්‍රීඩාංගනය නවීකරණය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ක්‍රීඩාංගනයට සිදු වී ඇති හානි සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) බණ්ඩාරවෙල ප්‍රදේශයේ ක්‍රීඩකයන්ට සහ පාසල් සිසුන්ට භාවිතා කිරීමට හැකි වන පරිදි ඉහත ක්‍රීඩාංගනය නවීකරණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2025 පෙබරවාරි 20 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

322/2024

ගරු අජිත් ගිහාන් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ඉතාලියේ රැකියා කරනු ලබන අතර ඔවුන්ගේ රියදුරු බලපත්‍ර අලුත් කර ගැනීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවක් වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) විදේශීය රැකියාවල නිරත වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අමානුෂික වද හිංසාවලට භාජනය වන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(v) විදේශ රැකියා ලබා දෙන බවට පොරොන්දු වී මුදල් වංචා කර සිටින ආයතන/ පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) වංචා කර ඇති මුදල් නැවත ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

379/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාව එක් එක් බන්ධනාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බන්ධනාගාරවල යටිතල පහසුකම්වල මේ වනවිට පවතින අඩුපාඩු කවරේද;

(iii) බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාරගත කරනු ලබන පුද්ගලයන් සඳහා පිහිටුවා ඇති පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුනරුත්ථාපන මධ්‍යස්ථානවල මේ වනවිට පුනරුත්ථාපනය කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් මධ්‍යස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් පුනරුත්ථාපනය කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

422/2025

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ ඇති පළාත් සභාව සතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ, රෝහල් නොවන වෙනත් සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන/ආයතන පළාත් සභාව සතුව තිබේද;

(iii) එසේ නම්, එම මධ්‍යස්ථාන/ආයතන කවරේද;

(iv) කළුතර දිස්ත්‍රික්කයේ ඇති රේඛීය අමාත්‍යාංශය සතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම දිස්ත්‍රික්කයේ, රෝහල් නොවන වෙනත් සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන/ආයතන රේඛීය අමාත්‍යාංශය සතුව තිබේද;

(vi) එසේ නම්, එම මධ්‍යස්ථාන/ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හා (v)හි සඳහන් මධ්‍යස්ථාන/ආයතන තුළ බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර ඒකක පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

424/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර මත වවුනියාව නගරයට පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය, වර්ෂ 2010-2011 කාලයේදී ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා කුඹුරු, ගොඩ ඉඩම්, නිවාස සහ ආගමික ස්ථාන අත්පත් කර ගන්නා ලද බවත්;

(ii) ගොවීන් සහ ඉඩම් හිමිකරුවන්ට අගතියක් නොවන අයුරින් මේ සම්බන්ධයෙන් ගොවි සංවිධාන, ප්‍රාදේශීය ලේකම් සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් 2013.11.05 වැනි දින අත්සන් කළ බවත්;

(iii) අත්පත් කර ගන්නා ලද ඉඩම් වෙනුවට ලබා දුන් විකල්ප ඉඩම්වලට මේ දක්වා බලපත්‍ර, විධිමත් වාරි පහසුකම් සහ ප්‍රවේශ මාර්ග සැකසීම සහ ප්‍රතිසංස්කරණය කිරීම කර නොමැති බවත්;

(iv) අගතියට පත් ගොවි පවුල්වල සාමාජිකයන්ට ප්‍රමුඛතා පදනම මත ඉහත ජල ව්‍යාපෘතිය යටතේ මේ දක්වා රැකියා ලබා දී නොමැති බවත්;

(v) අමුණුවලින් පිටවන අමතර ජලය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිසංස්කරණය කරන ලද වැව්වලට ලබා දීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

425/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වූ කාලය තුළ සුනඛයන් සපා කෑම හේතුවෙන් ප්‍රතිකාර ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ සුනඛයන්ගේ සපා කෑමට ලක්වූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාලය තුළ අයාලේ යන සුනඛයන්ගේ සපා කෑමට ලක්වූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුද්ගලයන් සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයේ එක් එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බලප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාලය තුළ සුනඛයන්ගේ සපා කෑමට වැඩි වශයෙන් ලක්වූ පුද්ගලයන් වෙසෙන දිස්ත්‍රික්කය කවරේද;

(v) සුනඛයන්ගේ සපා කෑමට ලක්වන පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සඳහා වාර්ෂිකව වැයවන මුදල කොපමණද;

(vi) සුනඛයන් සපා කෑමේ ගැටලුව විසඳීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 පෙබරවාරි 21 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

384/2025

ගරු වරුණ ලියනගේ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ සිට මේ දක්වා විවිධ ස්වාභාවික ආපදා හේතුවෙන් හානි වූ ජීවිත, විනාශ වූ දේපළ සහ ව්‍යාපාර වෙනුවෙන් ගෙවූ වන්දි මුදල සහ ගෙවීමට ඇති හිඟ වන්දි මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ආරම්භ කරන ලද රක්ෂණ ක්‍රමය, අංක 03/2016 දරන චක්‍රලේඛය මඟින් ස්ථාපිත කරන ලද අතර එය ආපදාවන්ට ලක් වූ ජනතාවට විශාල සහනයක් බව පිළිගන්නේද;

(iii) අංක 01/2020 දරන චක්‍රලේඛය මඟින් රු. 10,000/=ට වැඩි වන්දි සඳහා ඉඩමේ අයිතිය සනාථ කළ යුතු බව නියම කිරීම හේතුවෙන් විශාල පවුල් සංඛ්‍යාවකට වන්දි මුදල් නොලැබුණු බව දන්නේද;

(iv) ආපදා හේතුවෙන් පීඩාවට පත් වූ පවුලකට වියළි සහ පිසූ ආහාර ලබා දීම සඳහා දිනකට වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(v) ආපදා වන්දි තක්සේරු කිරීමේදී, 2020.09.09 දිනැති NBRO/FL/DA/IN/R5 චක්‍රලේඛය මඟින් නියම කරන ලද තක්සේරු වටිනාකම ප්‍රමාණවත් නොවන බැවින් තක්සේරු වටිනාකම වැඩි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

386/2025

ගරු චානක මාදුගොඩ මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ රටවල් ගණනාවක පුරවැසියන් E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා සඳහා යොමු වන බව දන්නේද;

(ii) E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන් කටුනායක ගුවන් තොටුපළේදී නැවත හරවා එවීමට හේතු කවරේද;

(iii) එම ශ්‍රී ලාංකිකයන්ට දකුණු කොරියාවේ රැකියා කිරීමට ඇති බාධා කවරේද;

(iv) E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන් සඳහා සාධාරණත්වය ඉටු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

388/2025

ගරු චන්දන සූරියආරච්චි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ සමූපකාර සමිතියේ ග්‍රාමීය බැංකු පද්ධතියේ මුදල් තැන්පත් කරන ලද තැන්පත්කරුවන් වෙත මුදල් නැවත ලබා දී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඉහත ග්‍රාමීය බැංකු පද්ධතියේ මූල්‍ය වංචාවක් සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඒ වංචාව සිදු වී ඇති කාලවකවානුව කවරේද;

(v) මුදල් නැවත ලබා ගැනීමට නොහැකි වී සිටින තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඔවුන්ගේ තැන්පත් මුදල් නැවත ගෙවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(vii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය ලියාපදිංචි කර නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

(iii) එම අධ්‍යක්ෂක මණ්ඩලයට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(iv) එම මූල්‍ය වංචාව සම්බන්ධයෙන් එවකට පළාත් සභාව සහ අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

417/2025

ගරු අරුණ පනාගොඩ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පල්දෝරු පද්ධතිය වර්ෂ ගණනාවක සිට අකර්මණ්‍ය වී ඇති බවත්;

(ii) එම පල්දෝරු පද්ධතිය වටා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මේ වනවිට වැටක් ඉදිකරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැට ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

(ii) එහි ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය හා ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා තෝරා ගෙන ඇති කොන්ත්‍රාත් ආයතනය කවරේද;

(iv) එම කොන්ත්‍රාත් ආයතනය තෝරා ගැනීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) එම වැට ඉදිකිරීම හේතුවෙන් ජනතාව විසින් වර්ෂ 40ක පමණ කාලයක සිට භාවිතා කරනු ලබන මාර්ග සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බව දන්නේද;

(vi) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

420/2025

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) ඒ අතරින් වනඅලින්ට ජීවත් වීම සඳහා සුදුසු වාතාවරණයක් සහිත වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම වනාන්තරවල ජීවත්වන වනඅලින් සංඛ්‍යාව කොපමණද;

(iv) වනඅලින් විසින් මිනිසුන් සහ ඔවුන්ගේ දේපළ විනාශ කරන බව දන්නේද;

(v) වර්ෂ 2020 සිට 2024 දක්වා වනඅලි ප්‍රහාරයන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව, එම ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ අලි - මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගිය වනඅලින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන සනත්වයට ඔරොත්තු නොදෙන වනඅලි ගහණයක් සිටින බව දන්නේද;

(ii) වන සනත්වයට උචිත පරිදි වනඅලි ගහණය පාලනය කිරීමට සිදුව තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා පවතින යාන්ත්‍රණ කවරේද;

(iv) ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, වනඅලින් සිදු කරනු ලබන විනාශය පාලනය කිරීම සඳහා යම් ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 පෙබරවාරි 22 සෙනසුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

423/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය බිඳ වැටෙමින් පවතින බව පිළිගන්නේද;

(ii) තේ නැවත වගාව සඳහා ක්‍රියාත්මක වූ 'ස්ටාර්' ව්‍යාපෘතියට මුදල් සැපයූ ආයතනය කවරේද;

(iii) සැපයූ මුළු මුදල කොපමණද;

(iv) එය ණයක්ද, නොඑසේ නම්, ප්‍රදානයක්ද;

(v) ණයක් නම්, වාර්ෂික පොලී අනුපාතය කොපමණද;

(vi) එම ණය ගෙවා අවසන් වන වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ පරිපාලන ව්‍යුහය හා ඊට සම්බන්ධ පුද්ගලයන් කවරේද;

(ii) එමඟින් නැවත තේ වගාව සිදු කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් තේ පරීක්ෂක කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ව්‍යාපෘතිය යටතේ නැවත තේ වගා කරන ඉඩම් අක්කරයකට ගෙවූ මුදල හා පරිපාලන වියදම්වලට වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට එම ව්‍යාපෘතිය අවසන් කර තිබේ නම්, එම දිනය කවරේද;

(ii) වගාකරුවන්ට හිඟ මුදල් ගෙවිය යුතුව තිබේ නම්, එය එක් එක් තේ පරීක්ෂක කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ විගණන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, අයි-රෝඩ් ව්‍යාපෘතිය යටතේ KL-2 ව්‍යාපෘතිය (කළුතර පැකේජ් 2) නමින් ව්‍යාපෘතියක් තිබූ බවත්;

(ii) අදාළ කොන්ත්‍රාත් සමාගම නීතිමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීම හේතුවෙන් ඉහත ව්‍යාපෘතිය අතරමග නවතා ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවකට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ අගලවත්ත සහ මතුගම මැතිවරණ බලප්‍රදේශ තුළ සංවර්ධනය කිරීමට නියමිතව තිබූ මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් සමාගම/සමාගම් කවරේද;

(iii) එම සමාගමේ/සමාගම්වල හිමිකාරිත්වය කවරේද;

(iv) ඉහත නීතිමය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

433/2025

ගරු දිනිඳු සමන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල, මීගහකිවුල නව නගරය ඉදිකිරීමට සමගාමීව මීගහකිවුල බස් නැවතුම්පළ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) මේ දක්වා එම බස් නැවතුම්පළ භාවිතයට ගෙන නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඉහත බස් නැවතුම්පළ ජනතාවගේ භාවිතය සඳහා ලබාදීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම බස් නැවතුම්පළ සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බස් නැවතුම්පළ ප්‍රයෝජනවත් නොවන ඉදිකිරීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීම පිණිස පළාත් පාලන ආයතනවලට කරනු ලබන මගපෙන්වීම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

436/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිත කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iii) සම්බාහන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේදී, 2023 අංක 19 දරන ආයුර්වේද (සංශෝධන) පනත අදාළ වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) සම්බාහන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේදී අදාළ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය, ශ්‍රී ලංකා පොලිසිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සහ මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතනවලට යම් වගකීමක් තිබේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

438/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් අතරින් දෙවන පාර්ශ්ව වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම ඉඩම් ලබා දී ඇති දෙවන පාර්ශ්වයේ නම, එම එක් එක් පාර්ශ්වයට ඉඩම් ලබා දී ඇති ග්‍රාම නිලධාරි වසම සහ ඉඩම් ලබා දී ඇති පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 පෙබරවාරි 24 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

445/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශේෂ බඳවා ගැනීම (හමුදාගත) යටතේ ත්‍රිවිධ හමුදාවට බඳවාගත් සෙබලුන් විවිධ වෘත්තීන්වල රාජකාරිවලට යොදවා ඇති බවත්;

(ii) ඔවුන්ට එම සේවාවලට ආවේණික නිල ඇඳුම් පැළඳීමකින් තොරව සිවිල් ඇඳුමින් හෝ වැඩ ඇඳුමින් රාජකාරි කිරීමට අවසර දී ඇති බවත්;

(iii) එම තත්ත්වය යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ තොරතුරු තාක්ෂණ අංශයේ රාජකාරිවල යොදවා සිටින සෙබලුන් 43 දෙනෙකුට නිල ඇඳුම් පළඳින ලෙස උපදෙස් දීමෙන් ගැටලුවක් නිර්මාණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශේෂ බඳවා ගැනීම යටතේ බඳවාගෙන ඇති සහ මේ වනවිට සේවය කරන සෙබලුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ රාජකාරි සහ හිමි වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සිවිල් ඇඳුමට අමතරව සේවාවලට ආවේණික නිල ඇඳුම් ඔවුන්ට පැළඳිය හැකිද;

(iv) එසේ නම්, එම අවස්ථා කවරේද;

(v) ඔවුන්ට අදාළ උපදෙස්/චක්‍රලේඛ/නියෝග නිකුත් කරන්නේ කවුරුන්ද;

(vi) ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි ඔවුන්ට නිල ඇඳුම් පැළඳීමට නියෝග කළ හැකිද;

(vii) ඉහත (අ) (iii)හි සඳහන් සෙබලුන් සේවා නිල ඇඳුමෙන් රාජකාරි සිදු කරන්නේද;

(viii) නොඑසේ නම්, සිවිල් හෝ වැඩ ඇඳුමෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

446/2025

ගරු ඔෂානි උමංගා මහත්මිය,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නව කර්මාන්තපුර ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

(iii) කර්මාන්තපුරවල කල්බදු පදනම මත කර්මාන්ත ස්ථාපිත කිරීමේදී, විවිධ ආයතනවලින් අනුමතිය ලබා ගැනීම සඳහා ආයෝජකයන්ට විශාල කාලයක් ගතවන බව දන්නේද;

(iv) එසේ නම්, එම කල්බදු ගිවිසුම් සකස් කිරීමේ ක්‍රියාවලියේ පවතින අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) අදාළ සියලු ආයතන ඒකාබද්ධ කර පහසු ක්‍රමවේදයක් සකස් කිරීමේ හැකියාවක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය සකස් කිරීම සඳහා ගතවිය හැකි කාලවකවානුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

447/2025

ගරු රුවන් විජේවීර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පැවති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර්වලින් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් ප්‍රමාණයේ වෙනස්වීම් සඳහා බලපා ඇති මූලික හේතු සාධක කවරේද;

(iii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය කවරේද;

(iv) එම දෙපාර්තමේන්තුව සතු ඉඩම් මහජන භාවිතයන් සඳහා යොදා ගතහැකි ප්‍රතිපාදන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

449/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු මෝදර සහ මාලිගාවත්ත පිහිටි ප්‍රදීපා ශාලා වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත දේශපාලන හිතවතුන්ට ලබා දී තිබේද;

(ii) ඒවා බදු පදනම මත ලබා දීමට පෙර රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ඒවායේ තක්සේරු වටිනාකම ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ප්‍රදීපා ශාලාවේ තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ප්‍රදීපා ශාලා බදු දීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ, මත්තෙගොඩ නිවාස සංකීර්ණයේ, බෞද්ධ මන්දිරයට යාබදව පිහිටි පර්චස් 116ක් විශාලත්වයෙන් යුතු ඉඩමේ පර්චසයක් රුපියල් ලක්ෂ 5 බැගින් ලබා දී තිබේද;

(ii) එම ඉඩම් කොටස් ලබා දී ඇත්තේ කවුරුන් වෙතද;

(iii) ඒවා නිවාස සෑදීමේ අරමුණ සඳහා ලබා දී තිබේද;

(iv) ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වටිනාකම ලබා ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

453/2025

ගරු අම්බිකා සාමුවෙල් මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ ස්වාභාවික සහ සමාජ ගැටලු හේතුවෙන් කඳුකරයේ වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වී සිටින බව දන්නේද;

(ii) එම ජනතාවගෙන් නිවාස අහිමි පුද්ගලයන් සහ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් තාවකාලික නිවාසවල පදිංචි වී සිටින කාලය කොපමණද;

(iv) එම ජනතාවට නිවාස ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 පෙබරවාරි 25 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙර මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කඩා දැමීමේ සිද්ධිය වාර්තා වූ දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ ආරක්ෂක නිලධාරින්ගේ නම් කවරේද;

(ii) පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යැමේදී එම ආරක්ෂක නිලධාරින්ට බලපෑම් එල්ල කරනු ලැබූ එවකට ආණ්ඩුකාරවරු සහ ආණ්ඩුවේ ප්‍රබල පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සිද්ධියට අදාළ පරීක්ෂණවල වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

62/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.01 වැනි දින සිට මේ දක්වා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබාදීම සඳහා අය කරනු ලබන ගාස්තුව කොපමණද;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් කඩිනමින් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

66/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තුව-උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නීති විරෝධී ලෙස ඉල්මනයිට් කැණීම් සිදු කරන බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට සෞඛ්‍ය, ජීවනෝපාය හා පානීය ජල ගැටලු ඇති විය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, නීති විරෝධීව සිදු කරන ඉල්මනයිට් කැණීම් කටයුතු තහනම් කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

82/2024

ගරු රෝහණ බංඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය සතුව මේ වනවිට ඇති ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ගුවන් ගමනාන්තයන් කවරේද;

(iii) මේ වනවිට ඉහත ආයතනයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත ආයතනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

90/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම සහල් ආනයනය කරන ලද රටවල් කවරේද;

(iv) එම සහල් ආනයනය කරන ලද ආයතන කවරේද;

(v) සහල් ආනයනය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

105/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගයට අදාළ ප්‍රශ්න පත්‍ර හෝ එම ප්‍රශ්න පත්‍රවල අන්තර්ගත ප්‍රශ්න, ඉහත විභාගය පැවැත්වූ දිනට පෙර බාහිර පාර්ශ්වයන් වෙත ලැබී තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) ඒ හේතුවෙන් අගතියට පත් වූ සිසුන් වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද;

(v) එම විභාගයේ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම අත්හිටුවා තිබේද;

(vi) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

153/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සුළං විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සුළං විදුලි බලාගාරයේ ධාරිතාවය (Installed Capacity) වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2022 සිට 2024 දක්වා එම එක් එක් සුළං විදුලි බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලද බලශක්ති ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාව තුළ සුළං මඟින් විදුලි බලය උත්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

188/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලිවැට ඉදිකිරීම සහ ඒවා නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අලි-මිනිස් ගැටුම හේතුවෙන් ඉහත කාල සීමාව තුළ දී මිය ගිය වනඅලින් සංඛ්‍යාව, මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව සහ සිදු වූ දේපළ හානි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලිවැට ඉදිකිරීමට සහ ඒවා නඩත්තු කිරීමට වැය කරන ලද මුදලට සාපේක්ෂව අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලැබී නැති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, අලි-මිනිස් ගැටුමට තිරසර විසඳුමක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

291/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "කොවිඩ්-19" වසංගත රෝගය වැළදීම හේතුවෙන් මියගිය පුද්ගලයන් භූමදානය කිරීම සඳහා සුදුසු ස්ථානය ලෙස හඳුනාගන්නා ලද මඩකලපුව "මජ්මා නගර්" සුසාන භූමිය, සුසාන භූමි ආඥාපනත අනුව අයත් වන පළාත් පාලන ආයතනය කවරේද;

(ii) එම සුසාන භූමියේ විශාලත්වය කොපමණද;

(iii) එම ඉඩම රජය සතු වන්නේද;

(iv) එසේ නම්, එම ඉඩම නීත්‍යානුකූල ලෙස අත්පත් කර ගන්නා ලද ගැසට් පත්‍රය ඉදිරිපත් කරන්නේද;

(v) එම අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සුසාන භූමියේ සංවර්ධන කටයුතු සඳහා රජය විසින් වෙන් කරන ලද මුදල සහ පෞද්ගලික පාර්ශ්වයන්ගෙන් පරිත්‍යාග ලෙස ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික පාර්ශ්වයන් විසින් ලබා දෙන ලද යන්ත්‍රෝපකරණ ඇතුළු වෙනත් දේපළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

389/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සභාපතිවරයාද ඇතුළුව වර්තමාන ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පත් කර ඇති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) සභාපතිවරයාද ඇතුළුව එම එක් එක් සාමාජිකයාගේ නම, මීට පෙර සේවය කර ඇති ආයතනය, දරා ඇති තනතුර සහ සමාජීය වශයෙන් සිදු කර ඇති කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මීට පෙර පැවති කොමිෂන් සභාවට පත් කර සිටි සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2025 පෙබරවාරි 28 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

258/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල වරාය ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති 'වරාය නගරය' ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ප්‍රතිලාභ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය හේතුවෙන් සිදු වන පරිසර බලපෑම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) මීට පෙර සිදු කර ඇති මහජන විරෝධතාවල ප්‍රතිඵලයක් ලෙස ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කර ඇති වෙනස්කම් කවරේද;

(iv) යෝජිත ව්‍යාපෘතිය හේතුවෙන් ජන ජීවිතයට සිදු වන බලපෑම සැලකිල්ලට ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

273/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ නගරය තුළ ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් මුළු ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) එම ඉඩම් අතරින් ආයෝජන ව්‍යාපෘති සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත ඉඩම් කවරේද;

(iii) එම එක් එක් ඉඩමේ සිදු කිරීමට අපේක්ෂිත ආයෝජන ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

303/2024

ගරු රවී කරුණානායක මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ නම කුමක්ද;

(ii) 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරු හෙබවූ තැනැත්තන්ගේ නම් කවරේද;

(iii) මේ දක්වා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාගත කරන ලද මුළු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iv) 2010, 2015, 2020, 2021, 2022, 2023 හා 2024 යන එක් එක් වර්ෂය තුළ සහ 2025 වර්ෂය තුළ මේ දක්වා සංස්ථාගත කරන ලද මුළු සමාගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සමාගමක් සංස්ථාගත කිරීමට ගන්නා ලද සාමාන්‍ය කාලය කොපමණද;

(vi) ඉහත (iii) අනුව සමාගම් සංස්ථාගත කිරීමෙන් දෙපාර්තමේන්තුව උපයා ඇති මුළු ආදායම කොපමණද;

(vii) ඉහත (iii) අනුව වර්තමානයේ ක්‍රියාත්මකව ඇති සක්‍රිය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(viii) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

426/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති, ජාතික යොවුන් සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(ii) කින්නියා ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ පුහුණු මධ්‍යස්ථානය වසා දමා ඇති අතර එය වෙනත් ප්‍රදේශයක ස්ථාපිත කර ඇති බව දන්නේද;

(iii) එම පුහුණු මධ්‍යස්ථානය වසා දැමීමට හේතු කවරේද;

(iv) එය වෙනත් ප්‍රදේශයක ස්ථාපිත කිරීමට හේතු කවරේද;

(v) එම පුහුණු මධ්‍යස්ථානය නැවත විවෘත කිරීම සඳහා බාධාවක් තිබේද;

(vi) නොඑසේ නම්, එම පුහුණු මධ්‍යස්ථානය නැවත විවෘත කිරීමට පියවර ගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

432/2025

ගරු අජිත් ගිහාන් මහතා, — පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීත්‍යානුකූල බලපත්‍ර මත සිදු කරනු ලබන වැලි, බොරලු, පස් සහ වැව් කැනීම් ප්‍රමිතියෙන් තොරව සිදු කිරීම හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල පරිසර විනාශයක් සිදු වන බව දන්නේද;

(ii) එම කැනීම් නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(iii) වැලි, බොරලු, පස් සහ වැව් කැනීම සඳහා සහ ඒවාට ප්‍රවාහන බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් නව ක්‍රමවේදයක් හඳුන්වා දී තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වයඹ පළාතේ විශාල පරිසර විනාශයක් සිදු කරමින් පවතින තත්ත්වයක් තුළ වයඹ පළාත් පරිසර අධිකාරියේ මැදිහත්වීම කවරේද;

(ii) එම අධිකාරියේ වගකීම කවරේද;

(iii) වයඹ පළාත් පරිසර අධිකාරිය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?